Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2015 Public Examination

# Sinhala
## Continuers Level

**Tuesday 20 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2015*

**Part A** (Questions 1–3)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space.

**Text 1**

1. (a) What was the important message delivered by the President of Sri Lanka? **2**

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

(b) Which actions have been taken by the government to achieve this result? **3**

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

Marks | You may make notes in this space.

**Text 2**

2\. (a) What evaluation is carried out by the foundation annually? **2**

______________________________________________

______________________________________________

______________________________________________

(b) Explain why the performance of the Nanasala project is considered to be a great achievement. **2**

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

(c) What are two of the Nanasala project's future goals? **2**

Goal 1 ______________________________________________

______________________________________________

Goal 2 ______________________________________________

______________________________________________

Marks

You may make notes in this space.

**Text 3**

3. (a) 'Dananjaya's achievement is an outstanding one.' Give **two** reasons to support this statement. **2**

(b) Using Dananjaya's experience as evidence, explain how 'willingness and perseverance' bring success. **2**

**Part B** (Questions 4–6)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 4**

4. (a) What was the guess made by Sarath about the interviewer's final question? **1**

ප්‍රශ්න විමසන්නාගේ අවසාන ප්‍රශ්නය පිළිබඳ සරත් කළ අනුමානය කුමක් ද?

______________________________________________________

______________________________________________________

(b) Give **three** reasons why Sarath is against the Super Stars programs. **3**

සරත් සුපිරි තරු වැඩ සටහන්වලට විරුද්ධ විමට හේතු **තුනක්** දක්වන්න.

______________________________________________________

______________________________________________________

______________________________________________________

______________________________________________________

(c) Identify **two** ways in which Sarath expressed his dislike of the Super Stars programs. **2**

සුපිරි තරු වැඩ සටහන් පිළිබඳව සරත්ගේ අප්‍රසාදය ප්‍රකාශ කළ විධි **දෙකක්** හඳුනා ගන්න.

______________________________________________________

______________________________________________________

______________________________________________________

______________________________________________________

______________________________________________________

Marks | You may make notes in this space.

**Text 5**

5. (a) Based on the text, give **three** reasons why Sinhala can be considered an important language in the world. **3**

පාඨයේ සඳහන් වන පරිදි සිංහල, ලෝකයේ වැදගත් භාෂාවක් ලෙස සැලකීමට හේතුවී ඇති කරුණු **තුනක්** දක්වන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

(b) What opportunities do students in Australia have with regard to the Sinhala language? **2**

සිංහල භාෂාව පිළිබඳව ඕස්ට්‍රේලියාවේ සිසුන් සඳහා ලැබී ඇති අවස්ථා මොනවා ද?

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

Marks | You may make notes in this space.

**Text 6**

6. (a) Identify the main differences between *baila* and *viridu*. **2**

බයිලා සහ විරිදු අතර ඇති ප්‍රධාන වෙනස හඳුන්වන්න.

(b) Explain the present-day role of *viridu*. **2**

වර්තමානයේ විරිදුවල කාර්යය පැහැදිලි කරන්න.

**End of Section 1**

BLANK PAGE

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2015** PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

### Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2015

**Part A** (Questions 7–8)
(10 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts (for example, by comparing, contrasting, summarising and/or evaluating) and convey the information appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the questions that follow.

**අලංකාර කොළඹ නගරයක්**
**වාර්තාකරු- ශාන් සිල්වා**

ශ්‍රී ලංකාවේ අග නගරයවූ කොළඹ, වඩා දියුණු සහ අලංකාර නගරයක් ලෙසින් නවීකරණය කිරීම බොහෝ බාධක මැද්දේ මීට වසර කිහිපයකට පෙර ආරම්භ කෙරුණි. එහි මුල් පියවර වූයේ පරිපාලන කාර්යාල සහ බඩු ගබඩා නගරාසන්න ප්‍රදේශවලට ගෙන යෑමය. ඉන් පසුව මාර්ග පද්ධතිය පිළිසකර කිරීම ආරම්භ විය. ප්‍රධාන මාර්ග අලුත්වැඩියා කිරීමෙන් පමණක් නොව පටු මාර්ග පුළුල් කිරීමෙන් ද, වාහන ගමනාගමනය පහසු කෙරුණි. පාර දෙපස හෝ මැද ගස් සිටුවා අලංකාර කරනු ලැබීය.

වතුර පල්වෙමින් තිබූ බේරේ වැව සහ ඇල මාර්ග සුද්ද කර, ඒ අවට උයන් සැකසිණි. ඊට අමතරව බේරේ වැවේ පාවෙන වෙළඳ පොළක් ද ඉදිවිය. කොළඹ නගරයේ මෙතෙක් තිබූ ප්‍රධාන උයන වූ විහාර මහාදේවී උයන ද වඩාත් අලංකාර කරනු ලැබීය.

කවදත් වෙළඳ මධ්‍යස්ථානයක්ව පැවති කොළඹ කොටුව ප්‍රදේශය, අහස උසට නැඟෙන තට්ටු ගොඩනැගිලි සහිත වඩාත් නවීන පන්නයේ වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට රජය අපේක්ෂා කරයි.

කොළඹ නගරය පැල්පත් වලින් තොර නගරයක් බවට පත් කිරීම රජයේ ඊළඟ අරමුණයි. අන් සියළුම කටයුතුවලට වඩා, රජයට අමාරුම කාර්ය වී ඇත්තේ පැල්පත් වාසීන්ව කොළඹ නගර සීමාවෙන් ඉවත් කර නගරාසන්න ප්‍රදේශවල පදිංචි කරවීමයි. සියළුම පහසුකම් සහිත තට්ටු නිවාස පැල්පත් වාසීන් වෙනුවෙන් ඉදිකර ඒවායේ අයිතිය ඔවුන්ට පැවරීමට රජය බලාපොරොත්තු වුව ද, සමහර පවුල් ඒ පිළිබඳව විරෝධය පලකර සිටියහ. කොළඹ නගරය තුල කුලී වැඩ හෝ සුළු වෙළඳාම් කරමින් ජීවත්වූ මිනිස්සු නගරයෙන් පිට ප්‍රදේශවල පදිංචියට යෑමට අකමැත්ත පළකර සිටිති. කෙසේ වුව ද නුදුරු අනාගතයේ දී එවැනි සුළු රැකියාවලට කොළඹ නගරයේ අවස්ථාවක් නොලැබෙන බැවින් ඔවුන්ට අවසාන තීරණයක් ගැනීමට සිදුවේ.

QUESTIONS

**Marks**

(a) Identify **three** steps taken to beautify the city of Colombo. **3**

(b) Provide evidence from the text that suggests the government has tried to make the changes seem positive to people already living in the city. **2**

(c) Explain why the reporter says, ‘These people will have to make a final decision’. **1**

8. Read the text and then answer in ENGLISH the questions that follow.

**විදෙස් ගත ලක් වැසියන්**
**දිලාන් දනසිරි**

පශ්චාත් උපාධියක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මම පසු ගිය මාසයේ දී, ඕස්ට්‍රේලියාවේ සිට ආපසු පැමිණියෙමි. එහි ගත කළ කෙටි කාලය තුළ මගේ අත්දැකීම් බෙදා ගැනීමටත්, ඕස්ට්‍රේලියාවේ වෙසෙන සිංහල ජනතාව පිළිබඳව තොරතුරු විදහා දැක්වීමටත් මෙම කෙටි ලිපිය ලියමි.

මා ඕස්ට්‍රේලියාවට යනතෙක් සිතා සිටියේ, මේ විදේශ ගත වන්නේ අප රටේ මුදලින් අධ්‍යාපනය ලබා, තම සුවපහසුව පමණක් පතා දියුණු රටවල් සොයා යන ආත්මාර්ථකාමී පිරිසක් ලෙසය. නමුත් වැඩි කාලයක් යෑමට පෙර මගේ ආකල්පය වෙනස් කර ගැනීමට සිදුවිය. ඔවුන් අප රටේ දිළිඳු ජනතාව හෝ අප රට මුහුණපාන ප්‍රශ්න අමතක කර නැති බව පැහැදිලිය.

ශ්‍රී ලංකාවේ දුෂ්කර පාසල්වලට අවශ්‍ය උපකරණ සපයා දීමට, විශ්වවිද්‍යාලවල සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමට ඔවුහු මුදල් එකතු කරති. රෝහල්වලට අත්‍යාවශ්‍ය උපකරණ සඳහා මුදල් සොයති. එපමණක් නොව නාය යෑම, ගං වතුර ගැලීම වැනි හදිසි ආපදාවලදී ද ඔවුන් උපයන මුදල් ඒ සඳහා පරිත්‍යාග කරති.

ඔවුහු තමන් උගත් පාසල් වල, විශ්වවිද්‍යාල වල ආදී සිසු සංගම්, සංස්කෘතික සංගම් ආදී විවිධාකාර සංගම් පිහිටුවා, ඒවා මඟින් මුදල් එකතු කිරීමට ආප්ප, ඉඳිආප්ප හෝ රොටී රාත්‍රීන්, විවිධ ප්‍රසංග හෝ ආධාර චිත්‍රපට දර්ශන සංවිධානය කරති. වැඩ සටහන කුමක් වුවත් අරමුණ ඉටුකර ගැනීම සඳහා ඔවුහු එක්රැස් වෙති.

තවද, ඔවුහු තම දරුවන්ට තමන්ගේ සංස්කෘතිය දායාද කිරීමට ද බොහෝ වෙහෙසෙති. සිංහල පාසල් සහ ආගමික මධ්‍යස්ථානවලට යවමින් භාෂාව උගන්වති. ජාතික සහ සංස්කෘතික උත්සවවලට සහභාගි කරවමින් අත්දැකීම් ලබා දෙති.

ශ්‍රී ලංකාවේ වෙසෙන සිංහල ජනතාව වැනි තවත් සිංහල ජන කොටසක් ඕස්ට්‍රේලියාවේත් මට හමුවීම ගැන මම අතිශයින්ම සතුටු වෙමි.

QUESTIONS

**Marks**

(a) Explain why the author is convinced that people who have migrated from Sri Lanka are still concerned about their motherland. **2**

(b) According to the text, how do Sri Lankan migrants in Australia try to maintain their cultural traditions? **2**

**Part B** (Question 9)
(15 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate an understanding of the stimulus text*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 7.

**ප්‍රවෘත්ති නිවේදනයක්**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගොවි ජනපදවල ජීවත්වන ජනතාව ඉතා අවාසනාවන්ත ලෙස වකුගඩු රෝගවලට භාජනයවී ඇත. මෙයට මූලික හේතුව වී ඇත්තේ, ඔවුන් බීමට ගන්නා ජලය විෂ රසායනික ද්‍රව්‍යයන් හා මිශ්‍රව තිබීමයි. පෞද්ගලික ආයතන මගින් පසට නොගැලපෙන, ප්‍රමිතියකින් තොර පොහොර වර්ග ආනයනය කර, අලෙවි කිරීම මීට මූලික හේතුව බව දැන් අනාවරණයවී ඇත. පොහොරවල තිබූ විෂ රසායනික ද්‍රව්‍ය වැසි ජලයෙන් සේදී ගොස් බීමට ජලය ගන්නා ඇල, දොලවලට එකතු වී ඇති බව වාර්තාවේ.

ජනයා වතුර උනු කළද, ඇතැම් විට සමහර විෂ රසායනික ද්‍රව්‍යයන් තවමත් රැඳී පවතින නිසා එය බීමට සුදුසු නොවේ. ඇත්තෙන්ම වෙළඳ පොලේ විවිධ ප්‍රමාණයේ වතුර බෝතල් මිල දී ගැනීමට තිබේ. එහෙත් සාමාන්‍ය ජනයාට ඒවා මිල දී ගැනීමේ හැකියාවක් නැත.

**වෛද්‍ය වාර්තාවක්**

වකුගඩු රෝගීන් රෝහල් ගතවී ප්‍රතිකාර ලබා ගැනීමට වහා පියවර ගත යුතුය. මේ සඳහා අවශ්‍ය වෛද්‍ය සේවා, උපකරණ, ඖෂධ සහ පහසුකම් කඩිනමින් ලබා දිය යුතුය. තවද මේ රෝගය පැතිර යෑම වැළැක්වීම සඳහා වහා ක්‍රියාත්මකවීම රජයේ වගකීමයි.

QUESTION

You are the president of a youth association. Write the informative text of a speech that you will give to the association, suggesting strategies that may assist the government to solve the problems outlined in the news item and the medical report above.

ඔබ තරුණ සංගමයක සභාපති වේ. ඉහත ප්‍රවෘත්ති නිවේදනයේ සහ වෛද්‍ය වාර්තාවේ සඳහන් ගැටළු විසඳීම සඳහා රජයට උපකාර විය හැකි ක්‍රියා පිළිවෙලක් යෝජනා කරමින්, එම සංගමයේ දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කතාවක විස්තරාත්මක සටහනක් ලියන්න.

---

You may make notes in this space.

*Do not remove this page from the question booklet.*

Student/Registration Number

Centre Number

Sinhala Continuers Level

Question 9



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2015 Public Examination

# Sinhala

## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2015

**Section 3** (Questions 10–12)
(20 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate depth of treatment of information, ideas and/or opinions*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. Write a formal, persuasive letter to a newspaper in Sri Lanka, emphasising the importance of secondary school driver education programs and urging readers to support them.

    ද්විතීයික පාසල්වල රියදුරු අධ්‍යාපන වැඩ සටහන්වල වැදගත්කම් අවධාරණය කරමින් ඒ සඳහා සියළු පාඨකයන්ගේ සහයෝගය ලබා දෙන මෙන් බලවත් ලෙස ආයාචනා කර ශ්‍රී ලංකාවේ පුවත්පතකට පොළඹවීමේ, විධිමත් ලිපියක් ලියන්න.

11. Write a personal letter to a friend in Sri Lanka, describing a hilarious incident that occurred when you were playing the main role in the Sinhala language school concert.

    සිංහල භාෂා පාසලේ විවිධ ප්‍රසංගයේ දී ඔබ රඟ පෑ ප්‍රධාන චරිතයක දී, සිදුවූ හාස්‍යජනක සිද්ධියක් පිළිබඳ විස්තර දක්වමින් ශ්‍රී ලංකාවේ මිතුරෙකුට/මිතුරියකට පෞද්ගලික ලිපියක් ලියන්න.

12. A group of divers diving off the coast of Sri Lanka discovered something very strange. Write an imaginative short story about what was discovered.

    ශ්‍රී ලංකාවේ ඈත මුහුදේ කිමිදීමට ගිය කණ්ඩායමක් අරුම පුදුම දෙයක් සොයා ගත්තේය. ඔවුන්ගේ ඒ සොයා ගැනීම අලලා මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

You may make notes in this space.

Question Number:

**End of Section 3**